2 වන පිටුවෙන්.......

## අඳුරු අප්‍රිකාවට සදහම් එළිය විහිදුවන...

ඔහු සාටකයක් පොරවා සිටියේය. උගන්ඩාවේ කිසි තැනක බෞද්ධ පන්සලක් හෝ බුදුදහමට සම්බන්ධ කිසිම සලකුණක්වත් නොවූයේය. මොහුට මේ කුමක් වී දැයි සියල්ලෝ මවිත වූහ. ඔහුගේ ආපසු පැමිණීම නෑදෑයිනට ප්‍රීතියක් වූ බව නිසැකය. ඒ වෙනුවෙන් ඔවුන් එළුවන් කුකුළන් ගෙනැවිත් සාදයක් පවත්වන්නට ලෑස්ති කළ විට ඒ සතුන් මරණවාට විරුද්ධත්වය පාමින් තමා වෙනුවෙන් කිසිම සතෙකුගේ පණ නොනැසිය යුතු බව ස්ටීවන් තරයේ කී විට ඔහුගේ කිසියම් විශාල වෙනසක් සිදුව ඇති බව ඔවුනට වැටහිණ.

නෑදෑයෝ ඔහු ළඟ තිබූ බෞද්ධ පොතපත දුටහ. ඔවුන් සියළු දෙනාම කීවේ ඒ බෞද්ධ පොතපත ගිනිතබා විනාශ කොට බයිබලය කියවා දෙවියන් වහන්සේගෙන් සමාව ගෙන නැවත ක්‍රිස්තියානි ආගමට එන ලෙසයි. එය කිසිසේත් කළ නොහැකි බව ස්ටීවන් කී විට එය කාගේත් කෝපයට හේතු විය. සමහරු ඉන්පසු ඔහු හා කතාකිරීම පවා අත්හළෝ ය.

තම කමරයට වී තනිවම භාවනාවේ යෙදුණු නමුත් තමාට ඒ කටයුතු සඳහා අධ්‍යාත්මික මාර්ගෝපදේශකයෙකු නොමැති අඩුව ස්ටීවන්ට දැඩිව දැනිණ. ඉන්දියාවේ හෝ ආසියාවේ රටක සිටියේ නම් ඔහුට අවශ්‍ය අය සොයාගත හැකිව තිබිණ. එහෙත් උගන්ඩාවේ එවැනි කෙනෙකු හෝ තමාට සමාගම් පැවැත්විය හැකි කෙනෙකු හෝ නැත. එබැවින් දෙවැනි වරට ද ගමරට හැරයා යුතුයයි ඔහු තීරණය කළේය. ඒ සිය අධ්‍යාත්මික ගවේශණය සම්පූර්ණ කරන බවට දැඩි අධිෂ්ඨානයෙනි.

උගන්ඩාවෙන් පිටව දකුණු ඇමරිකාවට ගිය ස්ටීවන් එහි වසරක් තැන තැන භාවනා මධ්‍යස්ථාන වල ගතකොට 1999 දී ඇමරිකාවේ මැසචුසෙට්හි විපස්සනා භාවනා මධ්‍යස්ථානයට (Insight Meditation Society) පැමිණියේය. එය ඔහුට විශාල සතුටක් වූයේ භාවනා ක්‍රම පිළිබඳව හසළ දැනුමැති ගුරුවරු ද විවිධ ක්‍රම හා පිළිවෙත්ද එහි දකිනු හැකිවීමයි. එම මධ්‍යස්ථානයේ අධ්‍යාත්මික ගුරුවරුන් අතර හේන්පොළ ගුණරතන නාහිමියන්ගේ සමීප ඇසුර ස්ටීවන්ට ඉමහත් සහනයක් විය.

*" භාවනා මධ්‍යස්ථානයේ ගත කළ කාලයෙන් පසු මා කුමන මාර්ගයක් ගත යුතුදැයි අවසානයේ මට තීරණයක් ගැන්මට සිදුවිය. ගිහියෙකු ලෙස ලෞකික ආශාවන්ගෙන් පිරී ධනය ඉපයීමේ යෙදෙනවාට වඩා, ශාසනයට ඇතුළුව මහණදම් පුරා සසර කෙටි කර ගැන්මේ මග තෝරා ගත යුතු යයි මම දැඩි ලෙස ඉටා ගත්තෙමි. "*

2001 වර්ෂයේ උගන්ඩාවේ ස්ටීවන් කබෝගෝසා, කැලිෆෝනියාවේ තථාගත භාවනා මධ්‍යස්ථානයේදී **බුද්ධරක්ඛිත** නමින් මහණව සසුනට ඇතුළ් විය. 2002 දී එහිදී ම උන්වහන්සේ උපසම්පදාව ලැබූහ.

බුද්ධරක්ඛිත හිමියන් මුහුණ පෑ ගැටළුව වූ කලී ඊළඟට කුමක් කරන්නද යන්නයි. ඉන්දියාවට හෝ නේපාලයට ගොස් එහි ගල්ගුහාවකට වී ස්වාර්ථය පිණිස බවුන් වඩනවාද? නැතහොත් තමා උපන් උගන්ඩාවට ගොස් එහි බුදු දහම පතුරුවන්නට මහන්සි ගන්නවාද යන්නයි. උගන්ඩාවට බුදුදහම තේරුම් කරදීම හා ඒ ජනයා කැමතිකරවා ගැන්ම ලෙහෙසි පහසු කාර්යයක් නොවන බව බුද්ධරක්ඛිත හිමියන්ට කල්පනා විය. එහෙත් ගුණරතන නාහිමියන් ඇතුළු භාවනා මධ්‍යස්ථානයේ අනෙක් හිමිවරු පැවසුවේ උගන්ඩාවට ගොස් බුදුදහමේ හරය එහි ජනතාවට වටහාදීම කළහැකි හා කළයුතු මහඟු කාර්‍යය බවයි.

දම්සක් පැවතුම් සූත්‍රය දෙසා බුදුහාමුදුරුවන් පස්වග මහණුන්ට උපදෙස් දුන්නේ බොහෝ දෙනාගේ හිතසුව පිණිස ධර්ම ප්‍රචාරයේ යෙදෙන්න යන්නය. එය මතකයට නැගූ බුද්ධරක්ඛිත හිමියෝ තම උපන්භූමියේ බුදුදහම රෝපණය කරන්නට යාමට ඉටාගත්හ.

♦ දයා

# Uganda Buddhist Centre
# උගන්ඩාවේ බෞද්ධ මධ්‍යස්ථානය



Buddhist community in Uganda weekly gather at the Buddhist Centre to listen to Dhamma talks and practice meditation

Ven. Bhante Buddharakkhitha (left) and his mother (on the far right) & the family members who have entered the Buddhist Order, here standing at the front of Buddhist Centre.





## Help Uganda!

Join hand with me in this challenging yet interesting mission of planting Dhamma seeds. People from the East could help by forming a forum or organisation called: **Friends of African Buddhist**. Something like that. Then, new Africa Buddhist will feel connected and supported by other fellow Buddhist. Members of **friends of Buddhist** could provide support in terms of sending volunteers to the Buddhist Centre, cultural exchange programs, send Dhamma books , multi-media and other forms of financial support. It is very difficult for one monk alone to do this work of sharing the Sublime Dhamma. Please visit our website for more info:

**www.ugandabuddhistcentre.org**

## My Renunciation

I made my decision that I would "escape" from worldly concerns. I had become dissatisfied with material wealth through my experiences in Thailand. I had found happiness in my study of Buddhism and wanted to devote my life to its study and practise. I would renounce a lesser happiness (worldly happiness) for what, to me, was a greater happiness ...my spiritual development.

By the end of the three months at IMS (Insight Meditation Society) retreat, at Massachusetts, USA, I realised even more clearly that true happiness comes from within and not from without.

Of course, we need external help (material things) to support our spiritual development but these external conditions are not the end all and, be all. They are simply a means to an end. If we make our material support the ultimate goal for our life then, this defeats the purpose of life. The Buddhist's purpose of life is to live a moral life and ultimately, to reach Nibbana.

**- Ven. Buddharakkhitha - Uganda**


## Duke's Court Travel

DUKE'S COURT TRAVEL

Fly to Colombo

| | | |
|---|---|---|
| SriLankan | SriLankan Airlines | fr £320 + Taxes |
| Qatar Airways | Qatar Airways | fr £300 + Taxes |
| Kuwait Airways | Kuwait Airways | fr £200 + Taxes |
| Emirates | Emirates | fr £545 + Taxes |
| | Oman Air | fr £165 + Taxes |

Note: All fares mentioned are low season / terms & conditions apply.

www.easy-flights.tv

020 8748 3535 / 0800 112 0535

AITO IATA

204 King Street, London W6 0RA



## ඔබේ මුදල් අදම යවන්න - අදම ලබාගන්න

FAST CASH
SEND TODAY - COLLECT TODAY

Transfer Fees From only £5

* කොමර්ෂල්, හැටන් නැෂනල් සහ ලංකා බැංකු සමග එක්ව, දිවයින පුරා 500කට අධික ශාඛා ජාලයකින් එදිනම මුදල් ලබාගැනීමේ පහසුව
* ලංකාවේ ඕනෑම බැංකු ගිණුමකට මුදල් ක්ෂණිකව බැර කිරීම
* ඔබගේ NRFC/RFC විදේශ ගිණුම් වලට මුදල් බැර කිරීම
* රටවල් 120කට මුදල් යැවීමේ පහසුව
* ඔබගේ මුදල් මැද පෙරදිග අතරමැදියන් වෙත නොයා ක්ෂණිකව හා සෘජුවම ගිණුමට බැර කිරීමේ විශ්වාසය

COMMERCIAL BANK BOC HNB HSBC
සම්පත් බැංකුව SampathBank PEOPLE'S BANK Standard Chartered

MCG Strong. Safe. Reliable.

www.efastcash.biz

020 8886 4488

Head Office: 125-127 Bramley Road, Oakwood, London, N14 4UT



Sanath Jayasuriya Global Brand Ambassador MCG